
WWW.OLEVELAPI.COM

# ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
# ජාතික ඇගයීම් හා පරීක්ෂණ සේවාව

## අධ්‍යයන පොදු සහතික පත්‍ර (සා.පෙළ) විභාගය - 2008

## ලකුණු දීමේ පටිපාටිය



WWW.OLEVELAPI.COM

# 33 - ඉතිහාසය - (නව නිර්දේශය)

මෙය උත්තර පත්‍ර පරීක්ෂකවරුන්ගේ ප්‍රයෝජනය සඳහා සකස් කෙරිණි. ප්‍රධාන පරීක්ෂක සාකච්ඡා පැවැත්වෙන අවස්ථාවේදී ඉදිරිපත් වන අදහස් අනුව මෙහි ඇතැම් වෙනස්කම් කරනු ලැබේ. මෙය පන්ති කාමර ඉගෙනුම්, ඉගැන්වීම් ක්‍රියාවලිය සඳහා ආධාරකයක් ලෙස යොදා ගත හැකිය යනු අපගේ විශ්වාසයයි.

අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ...

## ලකුණු බෙදීයාම.

I පත්‍රය - එක් පිළිතුරකට ලකුණු 02 බැගින්
02 × 40 - 80 යි.

II පත්‍රය - I, II හා III යනුවෙන් කොටස් තුනකි.
I කොටස - අනිවාර්ය ප්‍රශ්නයකින් යුක්ත ය. එය අ හා ආ යනුවෙන් උප කොටස් දෙකකි.

I අ (i) ලංකා ඉතිහාසයට සම්බන්ධ ඓතිහාසික ස්ථාන 10ක් ලංකා ආකෘති සිතියමක ලකුණු කිරීම.
(ii) ලෝක ඉතිහාසයට සම්බන්ධ ඓතිහාසික ස්ථාන 08ක් ලෝක ආකෘති සිතියමක ලකුණු කිරීම ද අපේක්ෂිත ය.
ලකුණු 10 + 08 - 18 යි.

ආ කෙටි ප්‍රශ්න 12 කින් යුක්ත ය.
ලකුණු ප්‍රමාණය 12 කි.

II කොටස

ලංකා ඉතිහාසයට අදාළ තේමා යටතේ සැකසුන ප්‍රශ්න 5කින් 3ක් තෝරා ගෙන පිළිතුරු ලිවීම අපේක්ෂිත ය.

III කොටස

ඉන්දියානු ඉතිහාසය, යුරෝපා හා ඈත පෙරදිග ඉතිහාසයට අදාළ තේමාවලින් සැකසුන ප්‍රශ්න 4කින් දෙකකට පිළිතුරු සැපයීම අපේක්ෂිත ය.

WWW.OLEVELAPI.COM

II හා III කොටස්වල සෑම ප්‍රශ්නයක් ම I, II, III, IV වශයෙන් අනුකොටස්වලට බෙදා ඇති අතර එම කොටස්වලට පිළිවෙලින් 3 + 4 + 5 + 6 බැගින් ලකුණු හිමි වේ. සෑම ප්‍රශ්නයකට ම මුළු ලකුණු ගණන 18 කි.

අවසාන ලකුණු ගණනය

| | | |
|---|---|---|
| I පත්‍රය - | ලකුණු | 80 |
| II පත්‍රය - | ලකුණු | 120 |
| | | 200 |

අවසාන ලකුණ 200 ÷ 2 - 100

අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ...

WWW.OLEVELAPI.COM



# ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
## இலங்கைப் பரீட்சைத் திணைக்களம்
# ජාතික ඇගයීම් හා පරීක්ෂණ සේවාව
## தேசிய மதிப்பீட்டிற்கும் பரீட்சித்தலுக்குமான சேவை

### අ.පො.ස. (සා.පෙළ) විභාගය 2008
### க.பொ.த.(சா.தர)ப் பரீட்சை 2008

විෂයය / பாடம் } ඉතිහාසය  විෂයය අංකය / பாட இலக்கம் } 33 S 1

### ලකුණු දීමේ පටිපාටිය - I පත්‍රය
### புள்ளி வழங்கும் திட்டம் - பத்திரம் I

| ප්‍රශ්න අංකය / வினா இல | පිළිතුර / விடை | ප්‍රශ්න අංකය / வினா இல | පිළිතුර / விடை | ප්‍රශ්න අංකය / வினா இல | පිළිතුර / விடை | ප්‍රශ්න අංකය / வினா இல | පිළිතුර / விடை |
|---|---|---|---|---|---|---|---|
| 01. | 3 | 11. | 3 | 21. | 2 | 31. | 3 |
| 02. | 1 | 12. | 2 | 22. | 3 | 32. | 2 |
| 03. | 2 | 13. | 3 | 23. | 4 | 33. | 3 |
| 04. | 4 | 14. | 2 | 24. | 2 | 34. | 4 |
| 05. | 2 | 15. | 4 | 25. | 3 | 35. | 2 |
| 06. | 4 | 16. | 3 | 26. | 2 | 36. | 2 |
| 07. | 1 | 17. | 2 | 27. | 2 | 37. | 3 |
| 08. | 2 | 18. | 1 | 28. | 4 | 38. | 3 |
| 09. | 4 | 19. | 2 | 29. | 2 | 39. | 3 |
| 10. | 2 | 20. | 2 | 30. | 2 | 40. | 4 |

W W W . O L E V E L A P I . C O M

විශේෂ උපදෙස් / விசேட அறிவுறுத்தல் } එක් නිවැරදි උත්තරයකට ලකුණු / ஒரு சரியான விடைக்கு (02) බැගින් / புள்ளி வீதம்

මුළු ලකුණු 02 x 40 = 80

අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ...

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
Department of Examinations, Sri Lanka

**33 S II**

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2008 දෙසැම්බර්
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2008 டிசெம்பர்
**General Certificate of Education (Ord. Level) Examination, December 2008**

| | | |
|---|---|---|
| ඉතිහාසය | II | පැය තුනයි |
| வரலாறு | II | மூன்று மணித்தியாலங்கள் |
| **History** | II | *Three hours* |

* I කොටසේ පළමුවන ප්‍රශ්නය අනිවාර්ය වේ.
* II කොටසින් ප්‍රශ්න තුනකට ද, III කොටසින් ප්‍රශ්න දෙකකට ද පිළිතුරු සපයන්න.
* පිළිතුරු සැපයිය යුතු මුළු ප්‍රශ්න සංඛ්‍යාව හයකි.

## I කොටස

**1.** 'අ'

පහත (i) යටතේ දක්වා ඇති ඓතිහාසික ස්ථාන සියල්ල ම සපයා ඇති ශ්‍රී ලංකා සිතියමෙහි ද, (ii) යටතේ දක්වා ඇති ඓතිහාසික ස්ථාන සියල්ල ම සපයා ඇති ලෝක සිතියමෙහි ද ලකුණු කොට නම් කරන්න.

(i) මහාතිත්ථ, සූරුළු වැව, කාරතිගාම, කොළඹ, ගන්නොරුව, ත්‍රිකුණාමලය, දෙවිනුවර, හල්දුම්මුල්ල(?), ගල්ඔය ජලාශය, ජජ්ජර නදී (ලකුණු 10 යි)

(ii) සින්ධු නදිය, කල්කටාව, රෝමය, සුවේස් ඇළ, හවායි දූපත්, කොන්ස්තන්තිනෝපල්, සුභ ප්‍රාර්ථනා තුඩුව, කොරියානු අර්ධද්වීපය (ලකුණු 08 යි)

'ආ'

(i) පහත A, B, C, D යටතේ දක්වා ඇති ඓතිහාසික සිද්ධි හා සම්බන්ධ පුද්ගලයින් කවුරුන් දැයි වරහන් තුළ දී ඇති ලැයිස්තුවෙන් තෝරා අනුපිළිවෙළින් ලියන්න.


A - බුදුන්වහන්සේ ආණ්ඩුකාරවරයා ශ්‍රී ලංකාවේ මුහුදු බඩ පළාත් පාලනය කළ අවධියේ දී උඩරට සිටි පාලකයා
B - ශ්‍රී ලංකාවේ බෞද්ධ පාසල් පිහිටුවීම සඳහා පුරෝගාමී මෙහෙවරක් ඉටු කළ පුද්ගලයා
C - ක්‍රි.ව. 1915 දී ඇතිවූ සිංහල-මුස්ලිම් කෝලාහල සමයේ දී හමු වීභාගයකින් තොරව සිරභාරයට පත්කළ නායකයින් නිදහස් කර ගැනීම සඳහා උද්‍යෝගිමත් මෙහෙවරක් ඉටු කළ තැනැත්තා
D - ශ්‍රී ලංකාවේ කර්මාන්තකරණය නගා සිටුවීමට මහත් උනන්දුවකින් කටයුතු කළ නිදහස් ශ්‍රී ලංකාවේ ප්‍රථම අගමැතිවරයා

[ ඩී.එස් සේනානායක, හෙන්රි ස්ටීල් ඕල්කට්, කීර්ති ශ්‍රී රාජසිංහ, පොන්නම්බලම් රාමනාදන්, හික්කඩුවේ ශ්‍රී සුමංගල හිමි, ශ්‍රීමත් ඩී.බී. ජයතිලක, ශ්‍රී වික්‍රම රාජසිංහ, ආරුමුග නාවලර් ]

(ලකුණු 04 යි)

(ii) පහත A, B, C, D යටතේ ඉදිරිපත් කොට ඇති කලා නිර්මාණ මොනවාදැයි අනුපිළිවෙළින් දක්වන්න.


A


B


C


D

(ලකුණු 04 යි)

(iii) පහත A, B, C, D යටතේ ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

A - දෙවන ලෝක මහා සංග්‍රාමයේදී කොළඹ හා ත්‍රිකුණාමලය යන නගර දෙකට ගුවන් ප්‍රහාරයක් එල්ල කරන ලද්දේ කවර රටක ගුවන් හමුදාවක් විසින් ද?
B - මුම්ටාස් මහල් දේවිය සිහිවීම සඳහා ටජ්මහල් මන්දිරය තනවන ලද්දේ කවර මෝගල් පාලකයා විසින් ද?
C - ඉන්දියාවේ කැලිකට් ප්‍රදේශයට ගොඩබට පළමු පෘතුගීසි යාත්‍රිකයා කවරෙක් ද?
D - කීර්ති ශ්‍රී රාජසිංහ රජුගේ කාලයේ දී සියම් දේශයෙන් උපසම්පදාව ගෙන ඒම සඳහා මුල් වූ පසුව සංඝරාජ පදවියෙන් පිදුම් ලද භික්ෂුන් වහන්සේ කවරෙක් ද? (ලකුණු 04 යි)

අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ...

WWW.OLEVELAPI.COM




ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

| | |
|---|---|
| ඉතිහාසය II<br>வரலாறு II<br>History II | 33 |

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2008 දෙසැම්බර්
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2008 டிசெம்பர்
General Certificate of Education (Ord. Level) Examination, December 2008

විභාග අංකය
சுட்டெண்
IndeX No. } ..............................





අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ...

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

ඉතිහාසය II
வரலாறு II
History II

33

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2008 දෙසැම්බර්
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2008 டிசெம்பர்
General Certificate of Education (Ord. Level) Examination, December 2008


අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ...

1. (ආ)

(i) A - ශ්‍රී වික්‍රම රාජසිංහ

B - හෙන්රි ස්ටීල් ඕල්කට්

C - පොන්නම්බලම් රාමනාදන්

D - ඩී. එස්. සේනානායක

ලකුණු 01 × 4 - 04 යි.

(ii) A - නටරාජා ප්‍රතිමාව

B - අශෝක ස්ථම්භය/ අශෝක කුලුණු හිස

C - සාංචි ස්තූපය

D - මොනාලිසා

ලකුණු 01 × 4 - 04 යි.

(iii) A - ජපානය

B - ෂාජහාන් රජතුමා

C - වස්කෝ ද ගාමා

D - වැලිවිට ශ්‍රී සරණංකර හිමි

ලකුණු 01 × 4 - 04 යි.

**02. නිපුණතාව : මුල් ආර්ය ජනාවාස පිහිටුවීම, ව්‍යාප්තිය හා ආර්ය ජනපදිකයන්ගේ ජීවන රටාව පිළිබඳ අවබෝධය පිරික්සීම.**

II කොටස

2. (i) මේ සමග ඇති ශ්‍රී ලංකා සිතියමෙහි මුල් ආර්ය සංක්‍රමණික කණ්ඩායම් ගොඩබට ස්ථාන තුනක් A, B, C යනුවෙන් දක්වා ඇත. ඒවා මොනවාදැයි නම් කරන්න. (ලකුණු 03 යි)

(ii) පහත සඳහන් ආර්ය ජනාවාස පිහිටියේ කවර ගංගා නිම්න ආශ්‍රිතව දැයි A, B, C, D අනුපිළිවෙළින් දක්වන්න.

A - අනුරාධගාම

B - දීඝගාම


C - උරුවේලගාම

D - මහාගාම

(ලකුණු 04 යි)

(iii) මුල් ආර්ය ජනපදිකයන්ගේ ආර්ථික රටාවේ ස්වභාවය සාධක දෙකක් ඇසුරෙන් පැහැදිලි කරන්න. (ලකුණු 03 යි)

(iv) මුල් ආර්යයන්ගේ පාලන ඒකකයක් වූ ගමෙහි තිබූ පාලනයේ ස්වභාවය, නායකත්වය සහ කාර්යයන් යටතේ විග්‍රහ කරන්න. (ලකුණු 08 යි)




2. (i) A - දඹකොළ පටුන/ ජම්බුකෝල පට්ටන

B - මහාතිත්ථ/ මාතොට/ මාන්තෙයි

C - ගෝකණ්ණ

ලකුණු 01 × 3 - 03 යි.

අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ...

(ii) A - කදම්බ නදී/ මල්වතු ඔය/ අරුවිආරු
B - ගාල්හ නදී/ ගල් ඔය
C - ගෝණ නදී/ කලා ඔය
D - කරින්ද නදී/ කිරිඳි ඔය

ලකුණු 01 × 4 - 04 යි.

(iii) - මූලික වශයෙන් අහස් දියෙන් හා කුඩා වාරි මාර්ග යටතේ වී වගාව.
- සත්ව පාලනය හා ගොඩ භෝග වගාව
- අවශ්‍යතා සීමාසහිත වීම හා ස්වයංපෝෂිත ආර්ථික රටාව
- එදිනෙදා ජීවිතයට අවශ්‍ය දේ ගම් මට්ටමෙන් නිපදවා ගැනීම
- භාණ්ඩ හුවමාරුව

කරුණු දෙකකට - ලකුණු 02
විස්තර කිරීමට - ලකුණු 03
ලකුණු 05

(iv) නායකත්වය
- ගමේ වැඩිහිටියකු නායකත්වය දරීම.
ගමික, ගමිණි නමින් නායකයා හැඳින්විය.
- ගමෙහි අනෙකුත් වැඩිහිටියන්ගේ බහුතර කැමැත්ත මත තීරණවලට එළඹීම.
- පසුකාලීන ව නායකත්වය පිය-පුතු ක්‍රමය මගින් තීරණය

කාර්යයන්
- රජු වෙනුවෙන් බදු එකතු කිරීම.
- ගමේ සුළු ආරවුල් විසඳීම.
- කෘෂි කාර්මික කටයුතුවලදී මූලිකත්වය ගැනීම.
- සුළු වාරිමාර්ග තැනීම හා නඩත්තුව

ලකුණු 06 යි.

WWW.OLEVELAPI.COM

අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ...

**03. නිපුණතාව : බටහිර ජාතීන්ගේ ආගමනයට පෙර ඇති වූ දේශපාලන සිද්ධීන් පිළිබඳ පසුබිම් දැනුම ද , එක්සත් ලංකාවක් බිහිකිරීමේ ව්‍යාපාරයේ දී පළමුවන විජයබාහු රජුගේ කාර්යභාරය ඇගයීම ද, රජරට ශිෂ්ටාචාරයේ පරිහානිය පිළිබඳ තුලනාත්මක අවබෝධය ද පිරික්සීම.**

3. (i) පහත සඳහන් ඓතිහාසික සිද්ධීන්ට සම්බන්ධ රජවරුන් කවුරුන් දැයි අනුපිළිවෙළින් දක්වන්න.
   A - වයඹදිග සහ නැගෙනහිර ප්‍රදේශවල සිටි ආර්ය සහ දේශීය ජන කොටස් අතර එකමුතු භාවයක් ඇති කොට අනුරාධපුරය අගනුවර බවට පත්කිරීම
   B - මෞර්ය අධිරාජයාගේ අනුග්‍රහය ඇතිව රාජාභිෂේකය පැවැත්වීම .
   C - දකුණු ඉන්දීය ආක්‍රමණිකයින්ට මෙන්ම තිස්ස බ්‍රාහ්මණයා ඇතිකළ කැරැල්ලට ද මුහුණ දෙමින් අහිමි වූ රාජ්‍ය බලය ස්ථාපිත කර ගැනීම (ලකුණු 03 යි)

(ii) බටහිර ජාතීන්ගේ ආගමනයට පෙර ශ්‍රී ලංකාවට එල්ල වූ විදේශ ආක්‍රමණ හතරක් නම් කරන්න. (ලකුණු 04 යි)

(iii) සොළී ආධිපත්‍යයෙන් රට බේරා ගැනීමටත් අනාගත සොළී ආක්‍රමණයකින් රට ආරක්ෂා කර ගැනීමටත් පළමුවන විජයබාහු රජු ක්‍රියාකළ ආකාරය නිදසුන් දෙකක් සපයමින් පැහැදිලි කරන්න. (ලකුණු 05 යි)

(iv) සියවස් පහළොවක් පමණ පැවති රජරට ශිෂ්ටාචාරය පරිහානියට පත්වීම කෙරෙහි බලපෑ කරුණු තුනක් විස්තර කරන්න. (ලකුණු 08 යි)

3. (i) A - පණ්ඩුකාභය රජතුමා

B - දේවානම්පියතිස්ස රජතුමා

C - වළගම්බා රජතුමා / වට්ටගාමිණී අභය

ලකුණු 01 × 3 = 03 යි.

(ii) - සේන ගුත්තික
- එළාර
- පුලහත්ථ, බාහිය ඇතුළු පිරිස
- කරිකාලන් චෝල
- පණ්ඩු, පාරින්ද ඇතුළු පිරිස
- ශ්‍රී මාර ශ්‍රී වල්ලභ (පාණ්ඩ්‍ය)
- I පරාන්තක, I රාජරාජ, I රාජේන්ද්‍ර (චෝල)
- කාලිංග මාඝ
- චන්ද්‍රභානු
- වෙනත් හෝ

WWW.OLEVELAPI.COM

ලකුණු 01 × 4 = 04 යි.

(iii) - බුදල්නා සෙනවියගේ ආධාර ඇතිව රුහුණු දේශය එක්සත් කිරීම.
- රුහුණු සේවාවන් සොළීන්ට විරුද්ධ ව මෙහෙයවීම.
- උපක්‍රමශීලී ව යුධ මෙහෙයුම් දියත් කිරීම.
- සොලීන්ට විරුද්ධ ඉන්දීය රාජ්‍යයන් සමඟ ඇති සම්බන්ධතා පවත්වා ගැනීම.

  නිදසුන් : කාලිංග දේශයෙන් තිලෝක සුන්දරී නම් කුමරිය විවාහ කර ගැනීම හා සම නැගණිය පාණ්ඩ්‍ය කුමාරයෙකුට විවාහ කර දීම.
- අනාගත ආක්‍රමණිකයන්ගෙන් ආරක්ෂා වීම සඳහා යුධ කඳවුරු ශක්තිමත් කිරීම.

නිදසුන් දෙකකට - ලකුණු 02

විස්තරයට - ලකුණු 03

ලකුණු 05

අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ...

WWW.OLEVELAPI.COM



(iv) - සිහසුන සඳහා පැවති දේශපාලන අරගල
- මධ්‍ය පාලනය දුර්වල වීම.
- වරින්වර එල්ල වූ විදේශ ආක්‍රමණ
- පළමුවන පරාක්‍රමබාහු රජුගේ විදේශ ආක්‍රමණ
- මාඝ ආක්‍රමණය හා එහි ප්‍රතිවිපාක

කරුණු තුනට - ලකුණු 03
විස්තර කිරීමට - ලකුණු 03
ලකුණු 06

**04. නිපුණතාව : පොළොන්නරු රාජධානිය පිරිහීමෙන් පසුව එළඹි යුගයේ දේශපාලන, ආර්ථික තොරතුරු පිළිබඳ අවබෝධය ද, හයවන පරාක්‍රමබාහු රජුගේ ශ්‍රේෂ්ඨත්වය ඇගයීමට ලක්කිරීමේ හැකියාව ද පිරික්සීම.**

4. (i) කාලිංග මාඝ රජරට පාලනය කළ සමයේ දිවයිනේ සෙසු ප්‍රදේශවල පාලනය ගෙනගිය ප්‍රාදේශීය පාලකයින් හට මධ්‍යස්ථාන ලෙස තෝරාගත් ස්ථාන තුනක් නම් කරන්න. (ලකුණු 03 යි.)
(ii) A - දඹදෙණිය සහ
B - කුරුණෑගල රාජධානි සමයන්හි ලියවුණු සාහිත්‍ය ග්‍රන්ථ දෙක බැගින් පහත ඇති ලැයිස්තුවෙන් තෝරා අනුපිළිවෙළින් ලියන්න.
(දළදා සිරිත, සැළලිහිණි සන්දේශය, සිංහල බෝධිවංශය, ගුත්තිල කාව්‍යය, කව්සිළුමිණ, සද්ධර්මරත්නාවලිය) (ලකුණු 04 යි)
(iii) ක්‍රි.ව. 13-15 සියවස් තුළ මෙරට ආර්ථිකය තුළ වර්ධනය වෙමින් පැවති ලක්ෂණ දෙකක් විස්තර කරන්න. (ලකුණු 05 යි)
(iv) හයවන පරාක්‍රමබාහු රජතුමා කෝට්ටේ යුගයේ සිටි ශ්‍රේෂ්ඨතම පාලකයා බව-සාධක තුනක් ඇසුරෙන් සනාථ කරන්න. (ලකුණු 06 යි)

(i) - යාපහුව / සුභපබ්බත
- මිනිපේ
- ගෝවින්දමලය
- දඹදෙණිය

ලකුණු 01 × 3 = 03 යි.

WWW.OLEVELAPI.COM

(ii) A - කව්සිළුමිණ, සද්ධර්මරත්නාවලිය
B - දළදා සිරිත, සිංහල බෝධි වංශය

ලකුණු 01 × 4 = 04 යි.

(iii) - කෘෂි ආර්ථික රටාව පිරිහෙමින් පැවතීම.
- කුළු බඩු වෙළෙඳාමට ප්‍රමුඛත්වයක් ලැබීම.
- පෙර අපරදිග රටවල් සමග විදේශ වෙළෙඳාම වර්ධනය වීම.
- ආර්ථික නිෂ්පාදන ක්‍රියාවලියේ දී තෙත් කලාපයට ප්‍රමුඛත්වයක් ලැබීම.

කරුණු දෙකට - ලකුණු 02
විස්තර කිරීමට - ලකුණු 03
ලකුණු 05

අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ...

(iv) - ශ්‍රී ලංකාව එක් සේසත් කිරීම.
- දකුණු ඉන්දිය තොටුපොළ ආක්‍රමණය කිරීම.
- පිරිවෙන් අධ්‍යාපනය හා සාහිත්‍යය ග්‍රන්ථකරණයට අනුග්‍රහ දැක්වීම.
- බෞද්ධ ආගමික ස්ථාන ඉදිකිරීම හා නඩත්තුව
- වෙනත් ආගම්වල දියුණුවට අනුග්‍රහ දැක්වීම.

කරුණු තුනකට - ලකුණු 03
විස්තර කිරීමට - ලකුණු 03
ලකුණු 06

**05. නිපුණතාව : පෘතුගීසි හා ලන්දේසි ජාතිකයන් උඩරට හා කෝට්ටේ රාජධානි සමග පැවැත් වූ සම්බන්ධතා තුලනාත්මකව විමසීමේ හැකියාව පිරික්සීම.**

5. (i) පෘතුගීසීන් ගොඩබට අවදියේ දී මෙරට පැවති රාජ්‍ය තුන නම් කරන්න. (ලකුණු 03 යි)
(ii) පහත සඳහන් ඓතිහාසික සිදුවීම් හා සම්බන්ධ පුද්ගලයින් A, B, C, D අනුපිළිවෙළින් නම් කරන්න.
A - ලංකාවට පැමිණි ප්‍රථම පෘතුගීසි ජාතිකයා
B - පෘතුගීසීන්ට විරුද්ධව මුල්ලේරියා සටන මෙහෙය වූ සිංහල කුමාරයා
C - ස්පිල්බර්ජන් නමැති ලන්දේසි ජාතිකයා මහනුවරට පැමිණි සමයේ දී උඩරට පාලනය කළ රජතුමා
D - දෙවන රාජසිංහ රජු සමයේ දී උඩරට සිරකරුවෙකු ව සිට පසුව ශ්‍රී ලංකාව ගැන කෘතියක් රචනා කළ ඉංග්‍රීසි ජාතිකයා (ලකුණු 04 යි)
(iii) කෝට්ටේ රාජධානිය පෘතුගීසි ග්‍රහණයට නතුවීමට මුල් වූ සාධක දෙකක් විස්තර කරන්න. (ලකුණු 05 යි)
(iv) කෙතෙක් උත්සාහ දැරුවද පෘතුගීසීන්ට හා ලන්දේසීන්ට උඩරට රාජ්‍යය යටත්කර ගැනීමට නොහැකිවූයේ ඇයිදැයි සාධක තුනක් යටතේ පැහැදිලි කරන්න. (ලකුණු 06 යි)

5. (i) - කෝට්ටේ
- කන්ද උඩරට
- යාපනය

ලකුණු 01 × 3 = 03 යි.

(ii) A - ලොරෙන්සෝ ද අල්මේදා
B - විදිය බණ්ඩාර / සීතාවක රාජසිංහ
C - පළමුවන විමලධර්මසූරිය
D - රොබට් නොක්ස්

WWW.OLEVELAPI.COM

ලකුණු 01 × 4 = 04 යි.

(iii) - විජයබා කොල්ලයෙන් පසුව කෝට්ටේ රාජ්‍යය කොටස් තුනකට වෙන්වීම.
- මායාදුන්නේ රජුට විරුද්ධ ව බුවනෙකබාහු රජතුමා පෘතුගීසි ආධාර පැතීම.
- ධර්මපාල කුමාරයා කතෝලික ආගම වැළඳ ගැනීම සහ තෑගි ඔප්පුවක් මගින් කෝට්ටේ රාජ්‍යය පෘතුගීසීන්ට පවරා දීම.
- පෘතුගීසීන්ට එරෙහි ව නැගී සිටීමට තරම් ප්‍රබල දේශීය පාලකයන් නොසිටීම.

කරුණු දෙකට - ලකුණු 02
විස්තර කිරීමට - ලකුණු 03
ලකුණු 05

අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ...

(iv) - උඩරට රාජ්‍යයේ ස්වභාවික ආරක්ෂාව (ජල, වන, ගිරි දුර්ග)
- වැසියන්ගේ රාජපාක්ෂික බව
- උඩරැටියන්ගේ සටන් ක්‍රම
- උඩරට භෞතික පරිසරය පිළිබඳ පෘතුගීසීන්ට හා ලන්දේසීන්ට දැනුමක් නොතිබීම.
- කුලී හමුදා තීරණාත්මක අවස්ථාවලදී සිංහල රජුගේ පැත්ත ගැනීම.
- උඩරට නායකයන්ගේ රණශූරත්වය හා උපායශීලී බව

කරුණු තුනකට - ලකුණු 03

විස්තර කිරීමට - ලකුණු 03

ලකුණු 06

**06. නිපුණතාව : ශ්‍රී ලංකාවේ බ්‍රිතාන්‍ය පාලන යුගයේ ක්‍රියාත්මක වූ දේශපාලන හා ආර්ථික වෙනස්කම් විමර්ශනය කිරීමේ හැකියාව**

6. (i) පහත සඳහන් සිද්ධීන් හා සම්බන්ධ පුද්ගලයින් තිදෙනා A, B, C අනුපිළිවෙළින් දක්වන්න.
A - බ්‍රිතාන්‍යයන් යටතේ ලංකාවේ මුහුදුබඩ පළාත්වල පාලනය සඳහා පත්කළ පළමුවන ආණ්ඩුකාරවරයා
B - ක්‍රි.ව. 1815 න් පසු උඩරට ප්‍රදේශ පාලනය සඳහා පත්කළ බ්‍රිතාන්‍ය නේවාසික නිලධාරියා (රෙසිඩන්ට්)
C - ක්‍රි.ව. 1848 පැන නැගුණු බ්‍රිතාන්‍ය විරෝධී අරගල සමයේ මෙරට සිටි බ්‍රිතාන්‍ය ආණ්ඩුකාරවරයා
(ලකුණු 03 යි)

(ii) දහනවවන සියවසේ මුල් භාගයේ දී උඩරට ප්‍රදේශවල කෝපි වගාව දියුණුවීමට බලපෑ සාධක **දෙකක්** දක්වන්න.
(ලකුණු 04 යි)

(iii) ක්‍රි.ව. 1848 න් පසු දේශීය කෘෂිකර්මය නගා සිටුවීම සඳහා බ්‍රිතාන්‍ය ආණ්ඩුව විශේෂ අවධානයක් යොමු කළේ ඇයි දැයි කරුණු දෙකක් ඇසුරෙන් පැහැදිලි කරන්න.
(ලකුණු 06 යි)

(iv) වතුවගා ක්‍රමය නිසා 19 වන සියවස තුළ ශ්‍රී ලංකා ආර්ථිකයේ සිදුවූ වෙනස්කම් තුනක් නිදසුන් සපයමින් විග්‍රහ කරන්න.
(ලකුණු 06 යි)

6. (i) A - සර් ෆ්‍රෙඩ්රික් නෝර්ත්
B - ජෝන් ඩොයිලි
C - වයිකවුන්ට් ටොරින්ටන්

ලකුණු 01 × 3 = 03 යි.

WWW.OLEVELAPI.COM

(ii) - කෝපි වගාවට අවශ්‍ය ඉඩම් අඩු මිලට විකිණීම
- භෞතික සාධක කෝපි වගාවට යෝග්‍ය වීම.
- දකුණු ඉන්දියානු ශ්‍රමය
- යුරෝපීය ප්‍රාග්ධනය හා ව්‍යවසාය
- රාජ්‍ය අනුග්‍රහය
- යුරෝපා වෙළඳපොලේ පැවති තරඟය අඩු වීම.
- එංගලන්තයට කෝපි අපනයනය කිරීමේ දී අය කළ තීරු බදු අඩු කිරීම.
- යුරෝපයේ කෝපි සඳහා පැවති ඉල්ලුම වැඩි වීම.

ලකුණු 02 × 2 = 04 යි.

අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ...

(iii) - දේශීය කෘෂිකර්මය නොසලකා හැරීමෙන් බ්‍රිතාන්‍ය පාලනයට විරුද්ධ ව ඇති විය හැකි විරෝධතා සමනය කිරීම.

- ගැමි කෘෂිකර්මය නගා සිටුවීම කළ යුතු බවට ශ්‍රී ලංකාවේ මෙන් ම බ්‍රිතාන්‍යයේ ද නිලධාරීන් හා පාලකයන් තුළ පැවති පිළිගැනීම.
- ආහාර අපනයනයට ගිය වියදම, දේශීය වශයෙන් කෘෂිකර්මය නගා සිටුවීමෙන් අඩු කර ගත හැකි වීම.
- මෙකල ආර්ථිකයේ ඇති වූ දියුණුව

කරුණු දෙකට - ලකුණු 02
විස්තර කිරීමට - ලකුණු 03
ලකුණු 05

(iv) - ආනයන - අපනයන ආර්ථික රටාවකට යොමු වීම.

- අපනයනය, බෝග කිහිපයකට සීමා වීම.
- ඉඩම් වෙළඳපලක් බිහිවීම.
- මධ්‍යම පංතිය හා කම්කරු පංතිය වර්ධනය
- යටිතල පහසුකම් දියුණු වීම.
- රටේ ප්‍රධාන ආදායම් මාර්ගය බවට වතුවගාව පත්වීම.

කරුණු තුනකට - ලකුණු 03
විස්තර කිරීමට - ලකුණු 03
ලකුණු 06

**07. නිපුණතාව : මගධයේ මුල් පාලකයන් පිළිබඳ දැනුම ද, එහි ව්‍යාප්තියේ පසුබිම ද, මෞර්ය හා ගුප්ත යුගයන් ඉන්දියා ඉතිහාසයේ සුවිශේෂත්වයක් ඉසිලීමට හේතු වූ සාධක පිළිබඳ අවබෝධය ද පිරික්සීම.**

III කොටස

WWW.OLEVELAPI.COM

7. (i) මෞර්ය රාජවංශය බලයට පත්වීමට පෙර මගධය පාලනය කළ රජවරුන් තිදෙනකු නම් කරන්න. (ලකුණු 03 යි)
(ii) මගධය ප්‍රබල රාජ්‍යයක් ලෙස නගා සිටුවීම සඳහා එහි මුල් පාලකයින් අනුගමනය කළ ක්‍රියාමාර්ග දෙකක් සඳහන් කරන්න. (ලකුණු 04 යි)
(iii) අශෝක රජතුමාගේ ආගමික සේවාව සාධක දෙකක් ඇසුරෙන් විස්තර කරන්න. (ලකුණු 03 යි)
(iv) "ගුප්ත යුගය ඉන්දියානු සංස්කෘතියේ ස්වර්ණමය යුගයයි." අධ්‍යාපනය හා සාහිත්‍ය ඇසුරෙන් මෙම කියමන පිළිබඳ අදහස දක්වන්න. (ලකුණු 06 යි)

7. (i) - බිම්බිසාර
- අජාසත්ත
- මහා පද්ම නන්ද
- ධන නන්ද

ලකුණු 01 × 3 = 03 යි.

අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ...

(ii) - විවාහ සම්බන්ධතා මගින් ප්‍රදේශ ලබා ගැනීම.
- යුද්ධ මගින් ප්‍රදේශ අල්ලා ගැනීම.
- මිත්‍ර සම්බන්ධතා මගින් අසල්වැසි රාජ්‍ය සමඟ සම්බන්ධතා පවත්වා ගැනීම.

ලකුණු 02 × 2 - 04 යි.

(iii) - තුන්වන ධර්ම සංගායනාව පැවැත්වීම.
- රට තුළ ද, අසල්වැසි රටවල ද බුදු දහම ප්‍රචාරය කිරීම.
- ආගමික සහනශීලී ප්‍රතිපත්තියක් අනුගමනය කිරීම.
- ආගමික ගොඩනැගිලි ඉදිකිරීම හා ප්‍රතිසංස්කරණය කිරීම. (බෞද්ධ, ජෛන, ....)
- වැසියන්ගේ සදාචාරය වර්ධනය කිරීමට කටයුතු කිරීම.

කරුණු දෙකට - ලකුණු 02
විස්තර කිරීමට - ලකුණු 03
ලකුණු 05

(iv) - බ්‍රාහ්මණ හා බෞද්ධ අධ්‍යාපනය නගා සිටුවීම සඳහා අධ්‍යාපන ආයතන පිහිටුවීම.
- පැවති අධ්‍යාපන ආයතන වැඩිදියුණු කිරීම.
- සමාජයේ විවිධ ස්ථරවලට අධ්‍යාපනය ලැබීමේ අවස්ථා සම්පාදනය කිරීම.
- පුළුල් විෂය මාලාවක් යටතේ අධ්‍යාපනය ලැබීමට අවස්ථා ලබා දීම.
- සාහිත්‍යකරුවන්ට රාජ්‍ය අනුග්‍රහය ලබා දීම.
- උසස් ගණයේ කෘති බිහිවීම.
- සංස්කෘත සාහිත්‍ය දියුණු වීම.

ලකුණු 06 යි.

**08. නිපුණතාව : ඉන්දියානු ජාතික ව්‍යාපාරයේ නායකත්වය හා එහි දේශපාලන පසුබිම පිළිබඳ විමර්ශනාත්මක අවබෝධය පිරික්සීම.**

8. (i) මහත්මා ගාන්ධි නායකත්වයට පැමිණීමට පෙර ඉන්දියානු ජාතික ව්‍යාපාරයට නායකත්වය දුන් පුද්ගලයින් තිදෙනකු නම් කරන්න. (ලකුණු 03 යි)
(ii) ඉන්දියානු ජාතික ව්‍යාපාරය මෙහෙය වූ ප්‍රධාන දේශපාලන සංවිධාන දෙක නම් කරන්න. (ලකුණු 04 යි)
(iii) බ්‍රිතාන්‍යයන් ඉන්දියාව තුළ අනුගමනය කළ ප්‍රතිපත්ති ක්‍රි.ව. 1857-1858 කැරැල්ල කෙරෙහි බලපෑ ආකාරය කරුණු දෙකක් ඇසුරෙන් පැහැදිලි කරන්න. (ලකුණු 05 යි)
(iv) මහත්මා ගාන්ධිතුමා බ්‍රිතාන්‍ය පාලනය පිටුදැකීම සඳහා කවර ක්‍රියාමාර්ගයක් අනුගමනය කළේදැයි සාධක දෙකක් ඇසුරෙන් පැහැදිලි කරන්න. (ලකුණු 06 යි)

8. (i) - දඩාභායි නාඕරෝජී
- ගෝඛාලේ ක්‍රිෂ්ණ
- සුරේන්ද්‍රනාත් බැනර්ජී
- බාල් ගංගාධාර් තිලක්
- බිපින් චන්ද්‍රපෝල්
- ලාලා ලජ්පත්රායි

ලකුණු 01 × 3 - 03 යි.

අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ...

(ii) - ඉන්දියානු ජාතික සංගමය

- මුස්ලිම් ලීගය

ලකුණු 02 × 2 - 04 යි.

(iii) - ක්‍රි.ව. 1857/1858 කැරැල්ල දීර්ඝ කාලයක් සිට ඉන්දියානුවන් තුළ බ්‍රිතාන්‍ය පාලනයට එරෙහි ව ඇතිවූ අප්‍රසාදයේ ප්‍රතිඵලයකි.

එහි ආසන්නතම හේතුව :

- සිපොයි භටයන්ට ග්‍රීස් තැවරූ පතරොම් නිකුත් කිරීමයි.

පසුබිම් වූ හේතු වශයෙන් :

- බ්‍රිතාන්‍යයන් ඉන්දියාවේ දේශීය රාජ්‍ය ඈදා ගැනීමේ දී අනුගමනය කළ අසාධාරණ ප්‍රතිපත්ති
- දේශීය ජන නායකයන් කෙරෙහි ප්‍රමාණවත් සැලකිල්ලක් නොදැක්වීම.
- බ්‍රිතාන්‍යයන් ඉන්දියාවේ දී ඉඩම් සහ බදු සම්බන්ධයෙන් අනුගමනය කළ ප්‍රතිපත්ති
- ඉන්දියාව තුළ ක්‍රියාත්මක වූ මිෂනාරි ව්‍යාපාරය කෙරෙහි ඇති වූ අප්‍රසාදය
- සති පූජා තහනම, ළමා විවාහ තහනම, වැන්දඹුවන්ට යළි විවාහවීමට නීතිමය අවසර ලබා දීම වැනි සමාජීය ප්‍රතිසංස්කරණ සාම්ප්‍රදායික ඉන්දියානුවන් නොරිස්සීම.
- බ්‍රිතාන්‍යයන් ඇති කළ යටිතල පහසුකම් නිසා ඉන්දියාවේ ප්‍රදේශවල හුදකලා බව නැති වී බටහිර ආභාෂයට විවෘත වීම හා ඒ කෙරෙහි ඇති වූ අප්‍රසාදය
- ඉන්දියාවේ සම්පත් බ්‍රිතාන්‍යයන් විසින් අසාධාරණ ලෙස යොදා ගැනීම.

කරුණු දෙකට - ලකුණු 02

විස්තර කිරීමට - ලකුණු 03

ලකුණු 05

(iv) - ගොවීන්ට හා කම්කරුවන්ට බ්‍රිතාන්‍යයන් යටතේ ඇති වූ අසාධාරණකම්වලට එරෙහි ව සත්‍යාග්‍රහ ව්‍යාපාරයක් ඇරඹීම.

මෙම සත්‍යාග්‍රහ ව්‍යාපාරය, පසු කාලයේ බ්‍රිතාන්‍යයන්ට එරෙහි ව විවිධ අවස්ථාවලදී යොදා ගැනුනි.

- සහයෝගිතා වර්ජන ව්‍යාපාරය ක්‍රියාත්මක කිරීම.
- සිවිල් නීති කඩ කිරීමේ ව්‍යාපාරය
- බ්‍රිතාන්‍යයන්ට ඉන්දියාවෙන් පිටවී යන ලෙසට බල කිරීමේ උද්ඝෝෂණ ව්‍යාපාර දියත් කිරීම.

මෙවැනි කරුණු ඇතුළත් විස්තරයකට ලකුණු 02 + 04 - 06 යි.

WWW.OLEVELAPI.COM

අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ...

**09. නිපුණතාව : කාර්මික විප්ලවයේ පසුබිම් තොරතුරු පිළිබඳ දැනුම ද, එහි යහපත් හා අයහපත් ප්‍රතිඵල තුලනාත්මකව ඇගයීමේ හැකියාව ද පිරික්සීම.**

9. "දහඅටවන සියවසේ අගභාගයේ දී ඇරඹි කාර්මික විප්ලවය විවිධ ක්ෂේත්‍රවල සීඝ්‍ර දියුණුවක් ඇති කිරීමට හේතු විය."
   (i) කාර්මික විප්ලවය මූලික වශයෙන් ආරම්භ වූ කර්මාන්ත ක්ෂේත්‍ර තුනක් නම් කරන්න. (ලකුණු 03 යි)
   (ii) කාර්මික විප්ලවය ප්‍රථමයෙන් ම එංගලන්තයේ ආරම්භ වීමට පසුබිම් වූ හේතු දෙකක් සඳහන් කරන්න. (ලකුණු 04 යි)
   (iii) ප්‍රවාහන ක්ෂේත්‍රයේ වෙනස්කම් ඇති කිරීමට කාර්මික විප්ලවය දායක වූ ආකාරය ඊට අදාළ නව සොයා ගැනීම් දෙකක් ඇසුරෙන් පැහැදිලි කරන්න. (ලකුණු 05 යි)
   (iv) "කාර්මික විප්ලවය නිසා යහපත් මෙන් ම අයහපත් ප්‍රතිඵල ද උදා වී ඇත." මේ බව නිදසුන් මඟින් සනාථ කරන්න. (ලකුණු 08 යි)

9. (i)
- රෙදි කර්මාන්තය
- යකඩ හා වානේ කර්මාන්තය
- ගල් අඟුරු කර්මාන්තය

ලකුණු 01 × 3 = 03 යි.

(ii)
- ගම්මට්ටමේ තිබූ තාක්ෂණය වැඩි දියුණු කර ගත හැකි වීම.
- ජනගහනය වර්ධනය වීම හා ඉඩම් කොටු කිරීමේ ව්‍යාපාරය නිසා ශ්‍රමය පහසුවෙන් ලබා ගත හැකි වීම.
- අමුද්‍රව්‍ය සුලභව තිබීම. යපස්/ ගල් අඟුරු
- කාර්මික අමුද්‍රව්‍ය යටත් විජිතවලින් ලබා ගත හැකි වීම.
- වෙළඳාම නිසා බිහි වූ ව්‍යවසායික පන්තිය
- පුළුල් වෙළෙඳපළක් තිබීම.

ලකුණු 02 × 2 = 04 යි.

(iii)
- වාෂ්ප බලය යොදා ගැනීම නිසා දුම්රිය, දුම් නැව් ප්‍රවාහනයට යොදා ගැනිනි. මේ නිසා මගී ප්‍රවාහනය මෙන් ම භාණ්ඩ ප්‍රවාහනය ද කාර්යක්ෂම විය.
- ඩෙම්ලර් විසින් ප්‍රථමයෙන් මෝටර් රථය නිපදවීම හා පසුව විවිධ මෝටර් වාහන නිපදවීම ඇරඹීම. මින් ගොඩබිම් ප්‍රවාහනය කාර්යක්ෂම විය.
- තාර යෙදූ මහා මාර්ග, දුම්රිය මාර්ග, පණිවුඩ හුවමාරු ක්‍රම, වරාය යන අංශයන් හි සිදු වූ වර්ධනය ප්‍රවාහන ක්ෂේත්‍රයේ දියුණුවට හේතු විය.

කරුණු දෙකට - ලකුණු 02
විස්තර කිරීමට - ලකුණු 03
ලකුණු 05

අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ...

(iv) යහපත් ප්‍රතිඵල

- භාණ්ඩ නිෂ්පාදනය ලාභදායී හා කාර්යක්‍ෂම වීම.
- ජනතාවගේ ආදායම් මට්ටම ඉහළ යාම.
- එදිනෙදා ජීවිතයේ කටයුතු කාර්යක්‍ෂම / පහසුවීම හා එහි ප්‍රතිඵල ලෙස කාලය ඉතිරිවීම.
- ජාත්‍යන්තර සහයෝගීතාව පුළුල් වීම.

අයහපත් ප්‍රතිඵල

- පරිසර දූෂණය
- නාගරීකරණය හා ඒ නිසා ඇති වූ තදබදය / සමාජ විරෝධී ක්‍රියා / දිළිඳුකම
- ශ්‍රම විභජනය නිසා නිර්මාණාත්මක හැකියා ඇහිරී යාම.

ලකුණු 06 යි.

(යහපත් හා අයහපත් ප්‍රතිඵල එක බැගින්වත් පිළිතුරේ අඩංගු විය යුතු ය.)

**10. නිපුණතාව : ලෝක මහා යුද්ධවලට සම්බන්ධ වූ රටවල්, නායකයන් හා මතවාද පිළිබඳ දැනුම් ද, ලෝක සාමය ඇති කිරීමේ සංවිධානයක් ලෙස එක්සත් ජාතීන්ගේ ක්‍රියා කලාපය ඇගයීමේ හැකියාව ද පිරික්සීම.**

10. (i) පළමුවන ලෝක සංග්‍රාමයේ දී මිත්‍ර පක්ෂය නියෝජනය කළ ප්‍රධාන රටවල් තුනක් නම් කරන්න. (ලකුණු 03 යි)

(ii) දෙවන ලෝක සංග්‍රාමයේ දී මිත්‍ර පක්ෂය නියෝජනය කළ ප්‍රධාන රාජ්‍ය නායකයින් දෙදෙනෙක් ද අක්ෂ පක්ෂය නියෝජනය කළ ප්‍රධාන රාජ්‍ය නායකයින් දෙදෙනෙක් ද නම් කරන්න. (ලකුණු 04 යි)

(iii) පළමුවන ලෝක සංග්‍රාමයෙන් පසු ජර්මනියේ සහ ඉතාලියේ බිහි වූ දේශපාලන මතවාද දෙක නම් කර ජර්මනියේ ක්‍රියා කලාපය දෙවන ලෝක සංග්‍රාමයට හේතු වූ ආකාරය කරුණු දෙකක් ඇසුරෙන් පැහැදිලි කරන්න. (ලකුණු 05 යි)

(iv) එක්සත් ජාතීන්ගේ සංවිධානය, රටවල් අතර ගැටුම් නිරාකරණය සඳහා කටයුතු කර ඇති ආකාරය නිදසුන් තුනක් ඇසුරෙන් පෙන්වා දෙන්න. (ලකුණු 06 යි)

10. (i)
- මහා බ්‍රිතාන්‍යය
- ප්‍රංශය
- රුසියාව
- අමෙරිකා එක්සත් ජනපදය

WWW.OLEVELAPI.COM

ලකුණු 01 × 3 = 03 යි.

(ii) මිත්‍ර පක්ෂය
- වින්ස්ටන් චර්චිල් (මහා බ්‍රිතාන්‍යය)
- ෆ්‍රැන්ක්ලින් ඩී රූස්වෙල්ට් (අමෙරිකා එක්සත් ජනපදය)
- ජෝශප් ස්ටාලින් (රුසියාව)
- චාල්ස් ඩි ගෝල් - ප්‍රංශය

අක්ෂ පක්ෂය
- ඇඩොල්ෆ් හිට්ලර් (ජර්මනිය)
- බෙනිටෝ මුසොලිනි (ඉතාලිය)
- හිරෝහිතෝ අධිරාජයා (ජපානය)

ලකුණු 01 × 4 = 04 යි.

අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ...

(iii) - ජර්මනිය - නව්සිවාදය

- ඉතාලිය - පැසිස්ට්වාදය

ජර්මනියේ ක්‍රියාකලාපය

- අසල්වැසි රාජ්‍ය ආක්‍රමණය කිරීමේ ප්‍රතිපත්තිය
- හිට්ලර්ගේ යුදෙව් විරෝධී ප්‍රතිපත්තිය
- පිරිසිදු ආර්ය ජාතියක් වූ ජර්මානුවන්ට ලෝක ආධිපත්‍යය හිමි විය යුතු බවට හිට්ලර් තුළ තිබූ දැඩි ආකල්පය

මතවාද දෙක නම් කිරීමට - ලකුණු 02

විස්තර කිරීමට - ලකුණු 03

ලකුණු 05

(iv) ගැටුම් නිරාකරණය කිරීම සඳහා

- සාම සාකච්ඡා පැවැත්වීම.
- ආර්ථික සම්බාධක පැවැත්වීම.
- හමුදා ක්‍රියාමාර්ග ගැනීම.
- නිරායුධකරණය
- න්‍යෂ්ටික අවිහරණය

(නිදසුන් තුනක් ඇසුරින් විස්තර කර ඇත්නම් ලකුණු 06 ලබා දෙන්න.)

WWW.OLEVELAPI.COM

අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ...